ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

## පුවත්පත් නිවේදනය

**<u>ශ්‍රී ලංකාවේ පළාත් පාලන නියෝජිතයන් 20 දෙනෙකු ඉන්දියාවේ ධාරිතා සංවර්ධන වැඩසටහනක් සඳහා සහභාගී වේ</u>**

ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රදේශයේ පළාත් පාලන නියෝජිතයන් 20 දෙනෙක් 2026 ජනවාරි 19-29 දක්වා දින 10ක් පුරා ඉන්දියාවේ හයිද්‍රාබාද් හි ග්‍රාමීය සංවර්ධන සහ පංචායති රාජ (NIRDPR) ආයතනයේ පැවති ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක් සඳහා සහභාගී වූහ. මෙම වැඩසටහන ලංකා කම්කරු කොංග්‍රසයේ ඉල්ලීම පරිදි සංවිධානය කරන ලදී.

2. අන්තර් ක්‍රියාකාරී සැසි සහ ක්ෂේත්‍ර චාරිකා ඇතුළත් වූ මෙම වැඩසටහනේදී සහභාගීවන්නන්ට පළාත් පාලනය, අය වැය සම්බන්ධ කරුණු, ස්වයං උපකාරී කණ්ඩායම් හරහා කාන්තා සවිබල ගැන්වීම, සහභාගිත්ව සැලසුම්කරණය සහ සංවර්ධනය, ප්‍රාථමික සෞඛ්‍ය සහ අධ්‍යාපනය, විකල්ප ජීවනෝපාය සංවර්ධනය, ආර්ථික සමීක්ෂණ සඳහා සරල ක්‍රම විධි සහ පාරිසරික සංචාරක කර්මාන්තය වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් දැනුම සහ අවබෝධය ලබා දෙන ලදී.

3. සහභාගීවන්නන් සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවය, අන්ගන්වාඩි මධ්‍යස්ථානය, සමුපාකාර බැංකු, කාන්තාවන් විසින් සංවර්ධනය කරන ලද කිරි ගොවිපළ, පලතුරු සහ උද්‍යාන විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය, නිල්ගිරිස් හි තේ වතු ඇතුළු ස්ථාන රැසක ක්ෂේත්‍ර චාරිකා ද සංවිධානය කර තිබිණ. ශ්‍රී ලංකාවේ පළාත් පාලන නියෝජිතයන් සඳහා විශේෂයෙන් සකසන ලද මෙම වැඩසටහන මගින් වෘත්තීය හැකියාවන් ශක්තිමත් කිරීමට, දැනුම බෙදා හදා ගැනීමට සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පළාත් පාලන ක්ෂේත්‍රය තුළ ආයතනික සබඳතා ගැඹුරු කිරීමට ප්‍රයත්න දරන ලදී.

4. මෙම වැඩසටහන ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ 2025 අප්‍රේල් නිල ශ්‍රී ලංකා සංචාරය අතරතුර දී නිවේදනය කරන ලද වැඩි දියුණු කරන ලද ධාරිතා සංවර්ධන රාමුව යටතේ ක්‍රියාත්මක කරන ලදී. මෙම රාමුව යටතේ ITEC වැනි දැනට ක්‍රියාත්මක යෝජනා ක්‍රමයන්ට අමතරව ශ්‍රී ලාංකික වෘත්තිකයන් සඳහා වාර්ෂිකව විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා 700ක් පිරිනැමේ. යහ පාලනය සඳහා ජාතික මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය අතර අත්සන් තබන ලද

අවබෝධතා ගිවිසුමක් යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවකයන් 300 දෙනෙකු සඳහා ද වාර්ෂිකව පුහුණු අවස්ථා හිමි වන අතර මේ අනුව ඉන්දියාවේ ධාරිතා ගොඩනැගීමේ ප්‍රයත්නයන් මගින් වාර්ෂිකව ශ්‍රී ලාංකිකයන් 1000 දෙනෙකුට ප්‍රතිලාභ සැලසේ.

***

කොළඹ
*2026 ජනවාරි 30*